රුහුණ විශ්වවිද්‍යාලය

## 2015/2016 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි - 2000 ස්ථලය
## දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු

## SLS 22573- සම්භාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍ය

පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

කාලය : පැය 03

---

1. පහත දැක්වෙන පද්‍යවල අර්ථය ලිහිල් බසින් ලියන්න.

I.

රතොට රතැදියෙම් කොපොල් පතලේ බිඳියෙම්
තනහස මුස කෙළෙම් නිදොසිම් ලු හා නුගියට

හස සමත පවන් කල්හර සඳිදුවර තෙප්
පැරැදැ ඇයතියෙන් හා කුරුරස වැ ම දුඹුල්හට

**කව්සිළුමිණ**, සංස්. ඇම්.බී. ආරියපාල,559,560 ගී

II.

සඳා නැඟෙන බලනෙව් තුරු කොළ'තුරිනි
එදා නිසඹු තොමො තම හට සැක වෙමිනි
සඳා සිතින් බොරු තතු හිමිට පාමිනි
සඳා වෙල සහල 'ඟුරු මැඩැ නිවූ වැනි

කුඹුයොන් සයුරු බොත එහි මිණි සේ අනත
නුබ කැට තෙලෙහි දිසි මෙන් තුරු පහන් වත
සැදැ සඳුට සදමින් මඟ නිසා කත
ඉසි වැනි නිමල් මලිගිය මල් සිය දිමුතු

**මයුර සන්දේශය**, සංස්. කුමාරතුංග මුනිදාස,99,100 පද්‍ය



114

III. තිසුලවි ගත් ක රින්
කළු පැහැ රැගත් උගු රින්
සම් සළු ගතඹ රින්
අඩක් උමයඟන ගත් සිරු රින්

ලත් මහ පද වියා
සිර සුර ගඟින් දෙ වියා
අනඟ රුව දැ වියා
යෙහෙක පුදකරන මහ දෙ වියා

**බුදුගුණාලංකාරය,** සංස්. කිරි ඇල්ලේ ඥාණවිමල හිමි,159,161 පද්‍ය

IV.

අසන රිසින් නයි කැල ඔස ලෝ යා
ඔවුන වෙතම සිටිනා ගුරු ලෝ යා
වයන එ වෙණනද ලොබම ක ලෝ යා
එදින වෛර සිත සිහි නොක ලෝ යා

රූ ර සේ අඳිනා ලෙසේ අත් ලෙළදිදී විදුලිය ප බා
ර න් ර සේ එක්වන ලෙසේ වෙණ නාද නූපා තබ ත බා
ක ම් ප සේ සැර දෙන ලෙසේ දෙස බල බලා නෙතගින් ස බා
මම් කෙසේ පවසම් එසේ වර සුරලඳුන් දුන් රඟ සු බා

**ගුත්තිල කාව්‍යය,** සංස්. ඩබ්.එෆ්. ගුණවර්ධන,299,309 පද්‍ය

(ලකුණු 20 යි)

2. සීගිරි කවියා ගැමි පරිසරය හා බැඳි උපමා යොදා ගැනීමට දැක්වූ රුචිකත්වය පිළිබඳ විමසීමක් කරන්න.

3. සියබස්ලකර කෘතියෙහි ඇති "පෙදෙන් බුදු සිරිතැ" නියමය සිංහල පද්‍ය සාහිත්‍යයේ ගමන් මග කෙරෙහි බල පෑ අන්දම පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

4. "කව්සිළුමිණේ එකොළොස් වැනි සර්ගය වස්තු විකාශනය මෙන් ම චරිත නිරූපණය සම්බන්ධයෙන් ඉතා වැදගත් වේ." මේ ගැන ඔබේ අදහස් දක්වන්න.

5. මයුර සන්දේශ කවියා ස්වභාව සෞන්දර්ය වර්ණනයේ දී දක්වා ඇති කුසලතාව අදාළ නිදසුන් අසුරින් පැහැදිලි කරන්න.

6. “ගුත්තිල කාව්‍යයෙන් ඉදිරිපත් වන්නේ සර්ව කාලීන සමාජ ධර්මතා සමූහයකි.” මේ ප්‍රකාශය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

7. බුදු දහමෙහි ශ්‍රේෂ්ඨත්වය පිළිබිඹු කිරීමේ උපක්‍රමයක් වසයෙන් සෙසු ආගම්වල නිස්සාරත්වය කවියට නැගීමට බුදුගුණාලංකාර කවියා පෙළඹී තිබේ දැ‘යි සනිදර්ශනව විමසන්න

(02-07 සෑම පිළිතුරකට ම ලකුණු 10 බැගිනි )

@@@@@@@@@@@@@@@@@@



115